# Combined Maths
# වෘත්තය

(01) $x^2+y^2=4$ වෘත්තයෙහි කේන්ද්‍රයෙහි ඛණ්ඩාංකය හා එහි අරය සොයන්න.

(02) $x^2+y^2+20x+10y+6=0$ වෘත්තයෙහි කේන්ද්‍රයෙහි ඛණ්ඩාංක හා එහි අරය සොයන්න.

(03) කේන්ද්‍රය $(1,2)$ද අරය ඒකක 4 ද වන වෘත්තයෙහි සමීකරණය සොයන්න.

(04) $(0,0)$, $(1,0)$, $(0,1)$ ලක්ෂ්‍ය හරහා යන වෘත්තයෙහි සමීකරණය සොයන්න.

(05) $x^2+y^2=18$ වෘත්තය මත පිහිටි $(3\ ,\ 3)$ ලක්ෂ්‍යයෙහි දී ඇඳි ස්පර්ශකයෙහි සමීකරණය සොයන්න.

(06) $(3\ ,0)$ හා $(9,0)$ යන ලක්ෂ්‍යයන් හරහා යමින් $x-1=0$ යන රේඛාව ස්පර්ශ කරන වෘත්ත දෙකේ සමීකරණ සොයන්න.

(07) $(6\ ,\ 2)$ ලක්ෂ්‍යය හරහා යන්නා වූ ද, x අක්ෂය ස්පර්ශ කරන්නා වූ ද $x-2y=0$ රේඛාව මත කේන්ද්‍රයන් පිහිටන්නා ද වෘත්ත දෙකේ සමීකරණ සොයන්න.

(08) x අක්ෂයට ඉහළින් කේන්ද්‍රය පිහිටා ඇති අරය $\sqrt{10}$ වූ වෘත්තයක් $(3\ ,\ 0)$ සහ $(-3\ ,\ 0)$ හරහා යයි. එහි සමීකරණය සොයන්න. AB පොදු ජ්‍යායය වන සේ, පළමු වැනි වෘත්තය ඡේදනය කරමින් ඒ වෘත්ත කේන්ද්‍රය හරහා යන තවත් වෘත්තයක් වේ නම් එම දෙවැනි වෘත්තයෙහි කේන්ද්‍රය සහ අරය සොයන්න.

(09) පළමු වැනි වෘත්ත පාදයෙහි වූ, ඒකක 5ක් අරයකින් යුත් වෘත්තයක කේන්ද්‍රය $(2t\ ,\ t)$ ලක්ෂ්‍යයෙහි පිහිටා ඇත. එම වෘත්තය $3x-4y+1=0$ රේඛාවෙන් ඒකක 8 ක අන්තඃඛණ්ඩයක් කපන්නේ නම්, t සොයන්න. දී ඇති රේඛාවට සමාන්තර වූ මෙම වෘත්තයෙහි ස්පර්ශකයන්ගේ සමීකරණයද සොයන්න.

(10) $x^2+y^2-2ax-8y+a^2=0$ වෘත්තය හා $x^2+y^2-4x-2y+4=0$ වෘත්තය ද බාහිර වශයෙන් එකිනෙක ස්පර්ශ කරන්නේ නම්, a සඳහා අගයයන් දෙකක් තිබිය හැකි බව



Scanned with CamScanner

පෙන්වන්න. වෘත්ත යුගලයන්හි ස්පර්ශ ලක්ෂ්‍ය දෙක A හා B වේ නම් AB= ඒකක 8/5 බව ඔප්පු කරන්න.

**(11)** එක් එක් වෘත්තය අක්ෂ දෙක ම ස්පර්ශ කරමින් (2 , 1) ලක්ෂ්‍යය හරහා ද ගමන් කරන වෘත්ත දෙකේ සමීකරණ සොයන්න. මේ වෘත්ත දෙකේ කේන්ද්‍ර යා කරන රේඛාව එම වෘත්තවල පොදු ජ්‍යායෙන් කුමන අනුපාතයක් අනුව බෙදේ දැයි සොයන්න.

**(12)** සියලුම තාත්වික a සඳහා $a(x-1)+y=4\sqrt{(1+a^2)}+3$ රේඛාව $x^2+y^2-2x-6y=6$ වෘත්තය ස්පර්ශ කරන බව ඔප්පු කරන්න. ඒ නයින් හෝ අන් ක්‍රමයකින් හෝ (9 , 2) ලක්ෂ්‍යයේ සිට එකී දෙන ලද වෘත්තයට ඇඳි ස්පර්ශක දෙකේ සමීකරණ සොයන්න.

**(13)** (6 , 0) ලක්ෂ්‍යය හරහා යන්නා වූ ද (4 , 2) ලක්ෂ්‍යයේ දී $(x-1)^2+(y+2)^2=25$ යන වෘත්තය ස්පර්ශ කරන්නා වූ ද වෘත්තයේ සමීකරණය සොයන්න. වෘත්ත දෙක අභ්‍යන්තරව ස්පර්ශ කරන බව පෙන්වා, කුඩා වෘත්තයේ කේන්ද්‍රයට ඉතා ම දුරින්, මහා වෘත්තය මත පිහිටි ලක්ෂ්‍යයේ ඛණ්ඩාංක සොයන්න.

**(14)** $4y-3x=7$ සමීකරණය ඇති l රේඛාව ස්පර්ශ කරන, අරය ඒකක 41/5 වූ වෘත්තයේ කේන්ද්‍රය, තුන් වැනි වෘත්ත පාදයේ සහ $4y=4x$ රේඛාව මත ද පිහිටා ඇත. එම වෘත්තයේ සමීකරණය සොයන්න.

**(15)** මුළුමනින් ම පළමු වැනි පාදය තුළ පිහිටිය වූ ද, අරය ඒකක 2ක් වූ ද, $4x^2+4y^2=1$ යන වෘත්තයත් x අක්ෂයත් ස්පර්ශ කරන්නා වූ ද, S නැමති වෘත්තයේ සමීකරණය සොයන්න. මූල ලක්ෂ්‍යයේ සිට S ට ස්පර්ශක අඳින ලද්දේ නම් එම ස්පර්ශකවල සමීකරණ ද, ස්පර්ශ ලක්ෂ්‍යවල ඛණ්ඩාංක ද සොයන්න.

**(16)** $x^2+y^2+2gx+2fy+c=0$ වෘත්තයේ විෂ්කම්භයක අන්ත ලක්ෂ්‍ය දෙකේ ඛණ්ඩාංක (3a , a) ; (a , 5a) වෙයි නම් g, f, c රාශිවල අගය a ඇසුරෙන් ලබා ගන්න. එම වෘත්තය y අක්ෂය මත සාදන අන්තඃඛණ්ඩය ද, මූල ලක්ෂ්‍යයේ සිට එම වෘත්තයට අඳින ස්පර්ශකයේ දිග ද a ඇසුරෙන් ලබා ගන්න.

**(17)** $x^2+y^2-1=0$ , $x^2+y^2-8x+7=0$ හා $x^2+y^2-6y+5=0$ වෘත්ත තුන එකිනෙක හා ස්පර්ශ වන බව ඔප්පු කරන්න. ස්පර්ශ ලක්ෂ්‍යවල දී අඳින ලද පොදු ස්පර්ශක තුනෙහි සමීකරණ සොයා මෙම ස්පර්ශක තුන ඒක ලක්ෂ්‍ය බව ද ඔප්පු කරන්න. ඉහත වෘත්ත තුන ප්‍රලම්බ ව ඡේදනය කරන වෘත්තයෙහි සමීකරණ සොයන්න.



Scanned with CamScanner

S වෘත්තයක් $3x^2+3y^2-5=0$ වෘත්තයෙහි පරිධිය සමච්ඡේදනය කරන අතර $P(1\ ,\ 2)$ හි සිට එම S වෘත්තයට ඇඳි ස්පර්ශක එකක් අනෙකට ලම්බ වෙයි. S හි කේන්ද්‍රයේ පථය $3x^2+3y^2+6x+12y-5=0$ බව පෙන්වන්න.

**(23)** k හි සියලු ම සංඛ්‍යාත්මක අගයන් සඳහා,

$\left(x^2+y^2+2g_1x+2f_1y+c_1\right)+k\left(x^2+y^2+2g_2x+2f_2y+c_2\right)=0$ යන සමීකරණය $x^2+y^2+2g_1x+2f_1y+c_1=0$ හා $x^2+y^2+2g_2x+2f_2y+c_2=0$ යන වෘත්තයන් හි ඡේදන ලක්ෂ්‍ය හරහා යන වෘත්තයක් නිරූපණය කරන බව පෙන්වන්න.

මූලය $x^2+y^2-2x-6y+2=0$ , $x^2+y^2-5x-8y+3=0$ යන වෘත්තයන් හි ඡේදන ලක්ෂ්‍ය හරහා යන වෘත්තයෙහි සමීකරණය සොයන්න.

එලෙසින් නිර්ණය කෙරෙන වෘත්තය දී ඇති වෘත්ත දෙකෙන් පළමු වැන්න ලම්බ ව ඡේදනය කරන බව පෙන්වන්න.

**(24)** $x^2+y^2+2gx+2fy+c=0$ හා $x^2+y^2+2g'x+2f'y+c'=0$ වෘත්ත ස්පර්ශ කරයි නම් ස්පර්ශ ලක්ෂ්‍යය $2(g-g')x+2(f-f')y+(c-c')=0$ හා $(f-f')x-(g-g')x+fg-fg'=0$ රේඛා එක එකක් මත පිහිටි බව පෙන්වන්න.

$x^2+y^2+2x+4y+1=0$ හා $x^2+y^2-4x+4y+k=0$ වෘත්ත ස්පර්ශ කරන්නේ k හි කුමන අගයන් සඳහා දැයි සොයා ඒ එක් එක් අවස්ථාවේ දී වෘත්ත ස්පර්ශ කරන්නේ බාහිරව ද නැතහොත් අභ්‍යන්තරව ද යන්න නිර්ණය කරන්න.

**(25)** සෑම t අගයකටම $(1-t^2)(x-h)+2t(y-k)=r(1+t^2)$ සරල රේඛාව $(x-h)^2+(y-k)^2=r^2$ වෘත්තය ස්පර්ශ කරන බව පෙන්වන්න.

$5(x^2+y^2)-6x+8y-35=0$ වෘත්තයේ ඒකක 4ක් දිග ජ්‍යා දෙකක් $x^2+y^2-2x-4y-11=0$ වෘත්තය ස්පර්ශ කරන සේ ඇඳිය හැකි බව පෙන්වා ඒවායේ සමීකරණය සොයන්න.

**26)** $x^2+y^2+2gx+2fy+c=0$ හා $x^2+y^2+2g'x+2f'y+c'=0$ වෘත්ත දෙක අභිලම්බව ඡේදනය කරයි නම්, $2gg'+2ff'=c+c'$ බව පෙන්වන්න.



Scanned with CamScanner

(18) (1 , 0) හා (-1 , 0) ලක්ෂ්‍ය හරහා වැටී ඇති සියලු ම වෘත්ත සඳහා වෘත්තයෙහි සාධාරණ සමීකරණය සොයන්න. මෙවැනි වෘත්ත දෙකක් $2x-y-3=0$ රේඛාව ස්පර්ශ කරන බව ද ඔප්පු කරන්න. මෙම වෘත්ත දෙක ප්‍රලම්බ ව ඡේදනය කරන බව ද පෙන්වන්න.

(19) $x^2+y^2+2gx+2fy+c=0$ වෘත්තය $x^2+y^2=r^2$ වෘත්තය ස්පර්ශ කරයි නම්, මෙය ඔප්පු කරන්න. $4r^2(g^2+f^2)=(c+r^2)^2$

විචල්‍ය වෘත්තයක් $x^2+y^2=4$ වෘත්තය ස්පර්ශ කරමින් ද, $x^2+y^2+8x-4y+12=0$ හි පරිධිය ද සමච්ඡේදනය කරයි. S කේන්ද්‍රය, $3x^2-4xy+24x-12y+36=0$ වක්‍රය මත පිහිටන බව ඔප්පු කරන්න.

(20) $(x_1, y_1)$ ලක්ෂ්‍යයෙහි සිට $x^2+y^2+2gx+2fy+c=0$ වෘත්තයට ඇඳි ස්පර්ශකයෙහි දිග සොයන්න.

A හා B ලක්ෂ්‍යයන් $x-y=0$ මත පිහිටා ඇත. මෙම ලක්ෂ්‍යවල සිට $S\equiv x^2+y^2-4x+3y+10=0$ වෘත්තයට ඇඳි ස්පර්ශකවල දිග ඒකක 4 ක් බැගින් වේ නම් A හා B හි ඛණ්ඩාංක සොයන්න.

A හා B හරහා වැටී ඇති සියලු ම වෘත්තවල සාධාරණ සමීකරණය සොයන්න.

ඒනයින් හෝ අන්ක්‍රමයකින් A හා B හරහා වැටී ඇත්තා වූ S=0 වෘත්තයෙහි පරිධිය සමච්ඡේදනය කරන්නා වූ ද වෘත්තයෙහි සමීකරණය $3x^2+3y^2-4x+16y-18=0$ බව ඔප්පු කරන්න.

(21) $g^2+f^2>c$ නම්, $x^2+y^2+2gx+2fy+c=0$ මගින් කේන්ද්‍රය (-g , -f) වූ ද අරය $\sqrt{(g^2+f^2-c)}$ වූ ද වෘත්තයක් නිරූපණය කරන බව පෙන්වන්න.

$x^2+y^2-20x+6y+84=0$ හා $x^2+y^2+24x-2y-80=0$ වෘත්තවලට ඇඳි පොදු ස්පර්ශක හතරෙහි සමීකරණය සොයන්න.

(22) p , m යනු පරාමිති නම්, $x^2+y^2-a^2+p(y-mx)=0$ යනු $x^2+y^2=a^2$ වෘත්තයෙහි පරිධිය සමච්ඡේදනය කරන වෘත්තයක සමීකරණය බව පෙන්වන්න.



Scanned with CamScanner

$x^2+y^2-x+3y+1=0$ වෘත්තය අභිලම්බව කපමින් $x+2y+1=0$ සරල රේඛාව ස්පර්ශ කරමින්, මූල ලක්ෂ්‍යය තුළින් යන වෘත්ත දෙකක් ඇඳිය හැකි බව පෙන්වා ඒවායේ සමීකරණය සොයන්න.

**(27)** $2g_1g_2+2f_1f_2=c_1+c_2$ නම් හා එනම් පමණක් $x^2+y^2+2g_1x+2f_1y+c_1=0$ හා $x^2+y^2+2g_2x+2f_2y+c_2=0$ වෘත්ත දෙක ප්‍රලම්බ බව පෙන්වන්න.

$x^2+y^2+4x+2y-4=0$ වෘත්තය ප්‍රලම්බව ඡේදනය කරන $x^2+y^2-4=0$ වෘත්තයෙහි පරිධිය සමච්ඡේදනය කරන ඕනෑම වෘත්තයක සමීකරණය $x^2+y^2+2\lambda x-4(\lambda+2)y-4=0$ ආකාරයෙන් දැක්විය හැකි බව පෙන්වන්න. මෙහි $\lambda$ පරාමිතියකි. මෙම වෘත්තය අචල ලක්ෂ්‍ය දෙකක් හරහා යන බව පෙන්වා එම ලක්ෂ්‍ය වල ඛණ්ඩාංක සොයන්න.

**(28)** කේන්ද්‍ර $y=x+1$ රේඛාව මත පිහිටන සේ $(3,7)$ ලක්ෂ්‍යය හරහා එක එකක අරය 3 වන වෘත්ත දෙකක් ඇඳිය හැකි බව පෙන්වන්න. මෙම වෘත්ත වල සමීකරණ සොයා ඒවා ප්‍රලම්බ ලෙස එකිනෙක ඡේදනය වන බව පෙන්වන්න.

**(29)** වෘත්ත දෙකක් ස්පර්ශ වීමට අවශ්‍යතාව ලියන්න. A හා B යනු $x^2+y^2-4x-9=0$ හා $x^2+y^2-6x-9=0$ වෘත්ත වල ඡේදන ලක්ෂ්‍ය වේ. A හා B හරහා යන S කුඩාතම වෘත්තයේ සමීකරණය සොයන්න.

A හා B හරහා යන අරය 5 වන S වෘත්තයේ සමීකරණයද සොයන්න. $x^2+y^2-4x-9=0$ වෘත්තය ස්පර්ශ කරන $\left(\frac{5+\sqrt{13}}{2},0\right)$ කේන්ද්‍රය වන වෘත්තයේ සමීකරණය සොයන්න. මෙම වෘත්තය A හා B හරහා යන S කුඩාතම වෘත්තයද ස්පර්ශ කරන බව පෙන්වන්න.

**(30)** $(x_1, y_1)$ සිට $x^2+y^2+2gx+2fy+c=0$ වෘත්තයට ඇඳි ස්පර්ශකයේ දිග සොයන්න. A හා B යනු $x-y=0$ රේඛාව මත ලක්ෂ්‍ය දෙකකි. මේ එක් එක් ලක්ෂ්‍යයේ සිට $S\equiv x^2+y^2-4x+8y+10=0$ වෘත්තයට ඇඳි ස්පර්ශකයේ දිග ඒකක 4 නම්, A හා B හි ඛණ්ඩාංක සොයන්න. A හා B මැදින් යන සියළු වෘත්ත වල සාධාරණ සමීකරණය සොයන්න.



Scanned with CamScanner

ඒනයින් හෝ අන්ක්‍රමයකින් හෝ A හා B මැදින් යන්නා වූ S=0 වෘත්තයේ පරිධිය සමච්ඡේදනය කරන්නාවූ වෘත්තයේ සමීකරණය $3x^2+3y^2-4x+16y-18=0$ බව පෙන්වන්න

**(31)** $x^2+y^2+2g_1x+2f_1y+c_1=0$ හා $x^2+y^2+2g_2x+2f_2y+c_2=0$ වෘත්ත වල පොදු ජ්‍යායේ සමීකරණය ලියා දක්වා වෘත්ත දෙක තලින් සඳහන්වී ඇති වෘත්තයෙහි විෂ්කම්භයක කෙළවර වලදී ඡේදනය වෙයි නම් එවිට $2g_1^2+2f_1^2-c_1=2g_1g_2-2f_1f_2-c_2$ බව පෙන්වන්න. $S_1$ හා $S_2$ පිළිවෙලින් $x^2+y^2-4x-by+6=0$ හා $x^2+y^2+4x+6y-22=0$ වන වෘත්ත වේ. S වෘත්තය, $S_1$ විෂ්කම්භයක දෙකෙලවරදී කපන අතර, $S_2$ වෘත්තය මගින් S වෘත්තයේ එක් විෂ්කම්භයේ දෙකෙලවරදී කපයි. S වෘත්තයේ කේන්ද්‍රයේ පථය $x^2+y^2=1$ වෘත්තය බව පෙන්වන්න.

**(32)** $(x_0, y_0)$ බාහිර ලක්ෂ්‍යයක සිට $x^2+y^2+2gx+2fy+c=0$ වෘත්තයට අදින ලද ස්පර්ශක වල ස්පර්ශ ජ්‍යායේ සමීකරණය $xx_0+yy_0+g(x+x_0)+f(y+y_0)+c=0$ බව පෙන්වන්න.

දෙන ලද වෘත්තයක හා දෙන ලද සරල රේඛාවක සමීකරණ පිළිවෙලින් $x^2+y^2+2x+6y+1=0$ සහ $4x+3y-5=0$ වේ. රේඛාව වෘත්තය නොකපන බව පෙන්වන්න. විචල්‍ය සරල රේඛාවක් දී ඇති වෘත්තය P සහ Q ප්‍රභින්න ලක්ෂ්‍ය දෙකකදී ඡේදනය කරන අතර P සහ Q හිදී වෘත්තයට වූ ස්පර්ශක දී ඇති සරල රේඛාව මත දී හමුවේ. මෙම විචල්‍ය රේඛාව අචල ලක්ෂ්‍යයක් හරහා ගමන් කරන බව පෙන්වා මෙම ලක්ෂ්‍යයේ ඛණ්ඩාංක සොයන්න.

**(33)** $x^2+y^2+2g_1x+2f_1y+c_1=0$ හා $x^2+y^2+2g_2x+2f_2y+c_2=0$ මගින් දෙනු ලබන වෘත්ත දෙක ප්‍රලම්බව ඡේදනය වේ නම්, එවිට $2g_1g_2+2f_1f_2=c_1+c_2$ බව පෙන්වන්න. OX අක්ෂය මත කේන්ද්‍රය පිහිටි S වෘත්තයක් $x^2+y^2-8x-6y+21=0$ මගින් දෙනු ලබන $S'$ වෘත්තය ප්‍රලම්බව ඡේදනය කරනු ලබන අතර $x^2+y^2+4x+6y+9=0$ මගින් දෙනු ලබන $S''$ වෘත්තය ස්පර්ශ කරනු ලැබේ. එකක් $S''$ වෘත්තය බාහිරව ස්පර්ශ කරන ලෙසද අනෙක $S''$ වෘත්තය අභ්‍යන්තරව ස්පර්ශ කරන ලෙසද වූ එවැනි වෘත්ත දෙකක් S ට ඇති බව පෙන්වන්න. මෙම වෘත්ත දෙකෙහි සමීකරණ සොයන්න.

**(34)** λ පරාමිතියක් විට $S+\lambda S'=0$ සමීකරණයෙන් $S \equiv x^2+y^2+2gx+2fy+c=0$ , $S' \equiv x^2+y^2+2g'x+2f'y+c'=0$ වෘත්ත වල ඡේදන



Scanned with CamScanner

ලක්ෂ්‍යය හරහා යන වෘත්තයක් නිරූපණය කරන බව පෙන්වන්න. $(15,-5)$ ලක්ෂ්‍යය හරහාත් $x^2+y^2-10x=0$, $x^2+y^2-4x-8y-30=0$ වෘත්ත දෙකෙහි ඡේදන ලක්ෂ්‍ය හරහාත් යන්නාවූ වෘත්තයේ සමීකරණය සොයන්න

**(i)** මෙම වෘත්ත තුන අතුරෙන් දෙකක් ප්‍රලම්බ ලෙස ඡේදනය වන බවත්

**(ii)** වෘත්ත තුනෙහි පොදු ජ්‍යාය මේ වෘත්ත අතුරෙන් එකක විෂ්කම්භය බවත් පෙන්වන්න.

**(35)** $lx+my+n=0$ සරල රේඛාව $(x-a)^2+(y-b)^2=r^2$ වෘත්තය ස්පර්ශ කරයි නම්, $(al+bm+n)^2=(l^2+m^2)r^2$ බව සාධනය කරන්න.

$3x+4y=0$ සරල රේඛාවට සමාන්තර ලෙස $S\equiv(x+1)^2+(y+2)^2-1=0$ වෘත්තයට අඳින ලද ස්පර්ශක දෙකේ සමීකරණ සොයන්න. එක එකක් මේ ස්පර්ශක දෙකත්, $S=0$ වෘත්තයත් ස්පර්ශ කරන වෘත්ත දෙකේ සමීකරණ සොයන්න.

**(36)** $g^2+f^2\geq c$ නම් $x^2+y^2+2gx+2fy+c=0$ මගින් කේන්ද්‍රය $(-g,-f)$ වූ ද අරය $\sqrt{g^2+f^2-c}$ වූ ද වෘත්තයක් නිරූපණය කරන බව පෙන්වන්න. $x^2+y^2-20x+6y+84=0$, $x^2+y^2+24x-2y-80=0$ වෘත්ත වලට ඇඳි පොදු ස්පර්ශක හතර සොයන්න.

**(37)** $x^2+y^2+2x-8y-8=0$ වෘත්තයට $5y-12x+33=0$ රේඛාව සහ $3x+4y-9=0$ රේඛාව ස්පර්ශ වේදැයි සොයන්න. මූල ලක්ෂ්‍යයේ සිට $x^2+y^2-5x-5y+10=0$ ඇඳි සමීකරණ සොයන්න.

**(38)** කේන්ද්‍රය OY අක්ෂය මත ඇති $S=0$ වෘත්තයක් මගින් $x^2+y^2+6x+2y-9=0$ හා $x^2+y^2-2x-2y+1=0$ වෘත්ත දෙක ප්‍රලම්බව ඡේදන වේ. $S\equiv x^2+y^2-5y+4=0$ බව පෙන්වන්න.

**(39)** $A\equiv(0,3), B\equiv(\sqrt{3},0), C\equiv(-\sqrt{3},0)$ ලක්ෂ්‍ය තුලින් යන වෘත්තයේ සමීකරණය සොයන්න.

**(i)** BC කුඩා වෘත්ත චාපයේ දිග සොයන්න.

**(ii)** AB විෂ්කම්භය වන වෘත්තයේ සමීකරණය සොයන්න.



Scanned with CamScanner

(iii) විචල්‍යය m අනුක්‍රමණය සහිත $y=mx-3$ සරල රේඛාව, A , B , C තුලින් වෘත්තය L හා M ලක්ෂය වලදී හමුවේ. LM හි මධ්‍ය ලක්ෂයේ පථය සොයන්න.

(40) $a^2+b^2=c$ නම්, $x^2+y^2+ax+by=0$ හා $x^2+y^24=c^2$ වෘත්ත දෙක එකිනෙක ස්පර්ශ කරන බව පෙන්වන්න. ස්පර්ශ ලක්ෂයයේ ඛණ්ඩාංක සොයන්න.

මූල ලක්ෂය හා $(1,0)$ තුලින් යන වෘත්ත දෙකක් $x^2+y^2=4$ යන වෘත්තය ස්පර්ශ කරයි. ස්පර්ශ ලක්ෂය වල ඛණ්ඩාංක සොයන්න. ස්පර්ශ ලක්ෂය, විශ්කම්භ දෙකෙලවර වන වෘත්තයේ සමීකරණය සොයන්න.

(41) $S\equiv x^2+y^2-2x-6y+1=0$ , $S\equiv 3x^2+3y^2-21x+2y+35=0$ වෘත්ත එකිනෙකට සම්පූර්ණයෙන්ම බාහිරව පිහිටා තිබෙන බව පෙන්වන්න.

S ගෙන් ඉතාමත්ම දුරින් S' මත වූ P ලක්ෂයයෙහි ඛණ්ඩාංක සොයන්න. P සිට S ට අඳින ලද එක් ස්පර්ශයක සමීකරණය $x=4$ බව පෙන්වා අනිකෙහි සමීකරණය සොයන්න.

(42) $2x^2+2y^2-3x+6y-2=0$ වෘත්තය $(0,-1)$ ලක්ෂය හරහා යන්නා වූ ද $y=2$ සරල රේඛාව මත කේන්ද්‍රය පිහිටියා වූ ද $S'=0$ සමීකරණය සොයා එම වෘත්තය $x^2+y^2=5$ වෘත්තයේ පරිධිය සමච්ඡේද කරන බව පෙන්වන්න.

(43) $u_1=0$ හා $u_2=0$ සරල රේඛා දෙකක ඡේදන ලක්ෂය හරහා යන ඕනෑම සරල රේඛාවක සමීකරණය $u_1+\lambda u_2=0$ බව පෙන්වන්න. $x+3y+5=0$ හා $2x-3y+8=0$ සරල රේඛා $\ell x+my+n=0$ රේඛාව මගින් A හා B දී ඡේදනය වේ. O මූලය නම් OA ,OB ලම්බක නම් $7n^2+18\ell n+9mn=40(\ell^2+m^2)$ බව පෙන්වන්න. $\ell$ ,m හා n විචල්‍යය වන විට O සිට $\ell x+my+n=0$ රේඛාවට ඇඳි ලම්බක අඩියේ පථය $x^2+y^2-18x-9y-40=0$ බව පෙන්වන්න.

(44) $\ell x+my+n=0$ සරල රේඛාව $(x-a)^2+(y-b)^2=c^2$ වෘත්තය ස්පර්ශ කිරීම සඳහා අවශ්‍යතාවය $(\ell a+mb+n)^2=c^2(\ell^2+m^2)$ බව ලබා ගන්න. $y=mx+c$ සරල රේඛාව ස්පර්ශ කරමින් $(0,a)$ හා $(0,-a)$ ලක්ෂ හරහා යන වෘත්ත දෙක එකිනෙක ප්‍රලම්බව ඡේදනය වෙයි නම් $c^2=a^2(2+m^2)$ බව පෙන්වන්න.


Scanned with CamScanner